# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2307/41 - 2022 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: මිල්/ ඉ4/2/94.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන පනතින්) සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැන්නත්තුඩාව ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද මු.පි.ක.4788 සහ 2022.08.15 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3502 ක් වූ පහත විස්තර කරන ඉඩම් කැබැල්ල.

**කැබලි අංක** 01.

ඉඩමේ නම: ජම්බුගහවත්ත ඉඩමේ විස්තරය, ගෙවත්ත ගරා වැටෙමින් පවතින ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කල්ලන්වියේ පියරතන හිමි සහ තවත් අය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.3502

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2023 ජනවාරි මස 16 දින පූ.භා. 10.00 ට මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023.01.09 දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී.ඒ.එන්.දිල්රුක්ෂි,
ප්‍රාදේශීය ලේකම්, මිල්ලනිය.

2022 නොවැම්බර් මස 17 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මිල්ලනිය.

EOG 11 - 0284

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: NYGM/LAN/10/අත්පත්/6.
සංවාරක හා ඉඩම් අමාත්‍යාංශ අංකය. :- ජේ/69/70/ඊ/368.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තිය යටතේ අංක 1972/15,002 හා 1972.03.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 07 වන වගන්තියේ දැන්වීමේ වන්දි පරීක්ෂණ දිනය සහ වේලාව 1972.05.05 පූ. හා. 09.00 යන්න 2022.12.27 දින පූ.හා. 10.00 ලෙසත් හිමිකම් ඉදිරිපත් කිරීමට ලබාදී ඇති දිනය 1972.04.20 යන්න 2022.12.20 යන්න ලෙසත් සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිමි.

ටී.ජී.එස්.සජීවනී,
ප්‍රාදේශීය ලේකම්
නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

2022 නොවැම්බර් මස 18 වැනි දින
නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

EOG 11– 0285/1

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: NYGM/LAN/10/අත්පත්/6.
සංවාරක හා ඉඩම් අමාත්‍යාංශ අංකය. :- ජේ/73/ඊ/473.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තිය යටතේ අංක *1977/259* හා 1977.04.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 07 වන වගන්තියේ දැන්වීමේ වන්දි පරීක්ෂණ දිනය සහ වේලාව 1977.ජූනි මස 14 පෙ.ව 11.00 යන්න 2022.12.27 දින පෙ.ව. 10.00 ලෙසත් හිමිකම් ඉදිරිපත් කිරීමට ලබා දී ඇති දිනය 1977 ජූනි 07 යන්න 2022.12.20 යන්න ලෙසත් සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිමි.

ටී.ජී.එස්.සජීවනී,
ප්‍රාදේශීය ලේකම්
නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

2022 නොවැම්බර් මස 18 වැනි දින
නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

EOG 11– 0285/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.